# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 60 දරන
# මෝටර් වාහන (විශේෂ විධිවිධාන)
# පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 60 දරන මෝටර් වාහන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 4 වන දින]

එල්. ඩී.—ඕ. 41/79.

**ඛනිජ තෙල් ද්‍රව වායුවෙන් මෝටර් වාහන ක්‍රියා කරවීම තහනම් කිරීම පිණිස ද භූමිතෙල්වලින් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් සමග භූමිතෙල් මිශ්‍ර කරන ලද මිශ්‍රණයකින් හෝ ක්‍රියා කරවනු ලබන මෝටර් වාහනවල අයිතිකරුවන්ට ඒ වාහන ලියාපදිංචි කිරීමට නියම කිරීම පිණිස ද ඒ වාහන සම්බන්ධයෙන් බද්දක් පැනවීම පිණිස සහ ඒ හා සම්බන්ධයෙන් වූ හෝ ඊට ආනුෂංගික වූ හෝ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 60 දරන මෝටර් වාහන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. ඛනිජ තෙල් ද්‍රව වායුවෙන් ක්‍රියා කරවනු ලබන යම් මෝටර් වාහනයක් කිසිම තැනැත්තකු විසින් සන්තකයේ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය. **ඛනිජ තෙල් ද්‍රව වායුව පාවිච්චිය තහනම් කිරීම.**

3. යම් මෝටර් වාහනයක් භූමිතෙල්වලින් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් සමග භූමිතෙල් මිශ්‍ර කරන ලද මිශ්‍රණයකින් හෝ ක්‍රියා කරවනු ලබන වාහනයක් ලෙස මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත් නම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ මෝටර් වාහනය ක්‍රියා කරවීමේ කාර්යය සඳහා භූමිතෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් සමග භූමිතෙල් මිශ්‍ර කරන ලද මිශ්‍රණයක් හෝ පාවිච්චි කරනු නොලැබිය යුතු ය. **භූමිතෙල්වලින් ක්‍රියාකරවනු ලබන මෝටර් වාහන ලියාපදිංචි කළ යුතු බව.**

4. (1) 3 වන වගන්තියේ සඳහන් මෝටර් වාහනයක සෑම අයිතිකරුවකු විසින් ම, මෙම පනත ක්‍රියාත්මක වන දින සිට දින තිහක කාලයක් ඉකුත්වීමට පෙර, භූමිතෙල්වලින් හෝ භූමිතෙල් මිශ්‍ර කරන ලද මිශ්‍රණයකින් හෝ ක්‍රියා කරවනු ලබන වාහනයක් ලෙස ඒ වාහනය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. **ලියාපදිංචි කිරීම සඳහා අයිතිකරු විසින් ඉල්ලුම් කළ යුතු බව.**

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක ඔහු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක දඩයකට ඔහු යටත් විය යුතු ය.

5. මෝටර් වාහන පනතේ යම් විධිවිධානවල කුමක් සඳහන් වුවද 1979 ජූලි මස 01 වන දිනයෙන් ආරම්භ වන සහ 1979 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා මෙහි වූ උප ලේඛනයේ I වන තීරයෙහි සඳහන් මෝටර් වාහන සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් බද්ද උචිත බලපත්‍ර අධිකාරිය වෙත ගෙවනු ලැබිය යුතු ය. **ඇතැම් මෝටර් වාහනවලට බද්දක් පැනවීම.**

ඒ 44072-13,400 (79/08)

බද්ද ගෙවීමේ දිනය සහ බද්ද නොගෙවීම සඳහා දණ්ඩනය.

6. (1) 5 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද 1979 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර උචිත බලපත්‍ර අධිකාරිය වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දින හෝ ඊට පෙර බද්ද ගෙවීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, රුපියල් තුන් දහසක් නොඉක්මවන දඩයකට, ඒ දඩය ඒ මහෙස්ත්‍රාත්වරයාගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවන්නේ වුව ද, ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් බදු මුදල (1) වන උපවගන්තියෙහි සඳහන් දින සිට මාස තුනක කාලයක් ඉකුත්වීමට පෙර උචිත බලපත්‍ර අධිකාරිය වෙත නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තර සහ ඒ බද්ද ගෙවීම පැහැර හරිනු ලැබ ඇති තැනැත්තාගේ නම සහ අවසාන වරට දන්න සිටි ඔහුගේ පදිංචි ස්ථානය ඇතුළත් සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත, බලපත්‍ර අධිකාරිය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා වෙත මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරනු ලැබූ දඩයක් වූවාක් මෙන් ඒ බද්ද අයකර ගැනීමට මහෙස්ත්‍රාත්වරයා ආඥා කළ යුතු ය.

පොලිස් නිලධරයාගේ බලතල.

7. මේ පනතේ විධිවිධානවලට පටහැනිව යම් තැනැත්තකු විසින් යම් මෝටර් වාහනයක් පාවිච්චි කරනු ලබන බවට යම් පොලිස් නිලධරයකුට සාධාරණ සැකයක් තිබෙන අවස්ථාවක, පරීක්ෂකවරයකු විසින් ඒ වාහනය පරීක්ෂා කිරීම අවසන් කරන තෙක් ඒ පොලිස් නිලධරයා විසින් ඒ වාහනය නතර කර රඳවා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

2 වන සහ 3 වන වගන්ති කඩ කිරීම සඳහා දණ්ඩනය.

8. 2 වන වගන්තියේ හෝ 3 වන වගන්තියේ හෝ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොඅඩු දඩයකට, ඒ දඩය ඒ මහෙස්ත්‍රාත්වරයාගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවන්නේ වුව ද, ඔහු යටත් විය යුතු ය.

පරීක්ෂණයේ සහතිකය සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු බව.

9. මේ පනත යටතේ යම් නඩු කටයුතුවල දී යම් මෝටර් වාහනයක් ක්‍රියා කරවීමේ කාර්යය සඳහා භූමිතෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් සමග භූමිතෙල් මිශ්‍ර කරන ලද මිශ්‍රණයක් හෝ පාවිච්චි කරන ලද්දේ ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක, තමා විසින් වාහනය පරීක්ෂා කරන ලද බවට ද, තම පරීක්ෂණයේ ප්‍රතිඵලය දැක්වෙන්නා වූ ද යම් පරීක්ෂකවරයකුගේ සහතිකය, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, ප්‍රස්තුත කාරණයට අදාළව ඒ සහතිකයෙහි සඳහන් යම් සිද්ධියක් හෝ මතයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත්, මුල් බැල්මට පෙනෙන, සාක්ෂි විය යුතු ය. තව ද, ඒ සහතිකය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න අසනු ලැබීම සඳහා පරීක්ෂකවරයා කැඳවනු ලැබීමට අධිකරණය විසින් අවසර දීම, විශ්වසනීය යයි අධිකරණයට පෙනී යන පටහැනි සාක්ෂි දෙනු ලැබ ඇති නම් මිස හෝ ඒ හරස් ප්‍රශ්න ඇසීම යුක්තිය ඉටුවීම පිණිස අවශ්‍ය යයි යම් හේතුවක් නිසා අධිකරණය සලකනු ලබන්නේ නම් මිස හෝ නොකරනු ලැබිය යුතු ය.

*ඇතැම් අවස්ථාවල දී ඛනිජ තෙල් ද්‍රව වායුව, භූමිතෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් භාවිත කිරීමට අවසර දීම.*

**10.** මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඛනිජ තෙල් ද්‍රව වායුව, භූමිතෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් මෝටර් වාහනවල පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම විද්‍යා කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් පවරන ලද යම් තැනැත්තකු විසින් ඒ පර්යේෂණ පවත්වනු ලබන බවට ඒ අමාත්‍යවරයා සෑහීමට පත්ව ඇති අවස්ථාවක දී අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව විද්‍යා කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින්, ලියවිල්ලක් මගින්, එහි සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසිවලට හා සීමා කිරීම්වලට යටත්ව, ඒ පර්යේෂණ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ඛනිජ තෙල් ද්‍රව වායුව, භූමිතෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් මෝටර් වාහනවල පාවිච්චි කිරීමට ඒ තැනැත්තාට බලය දෙනු ලැබිය හැකි ය.

*අර්ථ නිරූපණය.*

**11.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"පරීක්ෂකවරයා", "බලපත්‍ර අධිකාරිය", "ලොරිය", "මෝටර් රථය", "මෝටර් වාහනය", "රෙජිස්ට්‍රාර්වරයා", සහ "ට්‍රේලරය" යන පදවල, මෝටර් වාහන පනතෙහි පිළිවෙළින් දී ඇති අර්ථයන්ම ඇත්තේ ය; තවද

"ඛනිජ තෙල් නිෂ්පාදනය" යන්නෙන්, පැට්‍රල්, ඔටෝ—ඩීසල්, ඝන ඩීසල්, උඳුන් තෙල් සහ ගුවන්යානා ටර්බයින් ඉන්ධන අදහස් වේ.

[5 වන වගන්තිය]

උපලේඛනය

| I තීරුව<br>වාහනයේ පංතිය හෝ වර්ගය | II තීරුව<br>බද්ද<br>රු. ශ. |
|---|---|
| භූමිතෙල්වලින් හෝ වෙනත් යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් සමග භූමිතෙල් මිශ්‍ර කරන ලද මිශ්‍රණයකින් ක්‍රියා කරවනු ලබන මෝටර් වාහන— | |
| (අ) ඒ වාහනය, තාර බර හොන්ඩර 20 (කිලෝ ග්‍රෑම් 1,016) ක් නොඉක්මවන මෝටර් රථයක් වූ විට | 600.00 |
| (ආ) ඒ වාහනය, තාර බර හොන්ඩර 20 ක් වූ හෝ හොන්ඩර 20 (කිලෝ ග්‍රෑම් 1,016) ක් ඉක්මවන මෝටර් රථයක් වූ විට ... ... | 1,200.00 |
| (ඇ) ඒ මෝටර් වාහනය, තාර බර හොන්ඩර 100 (කිලෝ ග්‍රෑම් 5,080) ක් නොඉක්මවන (ට්‍රේලරයක් නොවන) ලොරියක් වූ විට ... ... | 1,200.00 |
| (ඈ) ඒ මෝටර් වාහනය, තාර බර හොන්ඩර 100 ක් වූ හෝ හොන්ඩර 100 (කිලෝ ග්‍රෑම් 5,080) ක් ඉක්මවන (ට්‍රේලරයක් නොවන) ලොරියක් වූ විට ... | 2,400.00 |